ඩුබායි දහම් පාසල

Dubai Dhaham Pasala

http://www.dhahampasala.org/

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය: E/A.D/ද.පා/ ඩී/ 001

# 13 වන සංවත්සර උත්සවය

2001 වසරේ ආරම්භ වූ අප දහම් පාසලට, 2014 අප්‍රේල් මස 21 වැනි දිනට
වසර 13ක් සම්පූර්ණ වන්නේය.
දහම් පාසලේ 13 වැනි සංවත්සර උත්සවය,
පූජ්‍ය ගැටමාන්නේ ගුණානන්ද ස්වාමින්වහන්සේගේ අනුශාසකත්වයෙන්
අප්‍රේල් මස 25 වැනි සිකුරාදා උදෑසන 8.45 සිට දහම් පාසල් ශාලාවේ පැවැත්වේ.
ගරු ශ්‍රී ලංකා තානාපති ආචාර්ය රන්ජිත් බාලසූරිය මැතිතුමා සහ
ශ්‍රී ලංකා කොන්සල් ජෙනරාල් අබ්දුල් රහීම් මැතිතුමාද
සහභාගී වන මෙම උත්සවයේදී අප දහම් පාසල් දරුවන් හට පහත සඳහන්
සහතික සහ ත්‍යාග පිරිනැමීමද කෙරෙනු ඇත.

- චිත්‍ර තරඟය
- අත් අකුරු තරඟය
- තුන් සූත්‍රය කට පාඩම් දීම
- නොකඩවා අවුරුදු 7ක් දහම් පාසලට පැමිණීම.

සහභාගී වන දරුවන් හට සුළු ආහාරයක් ද, දහම් පාසලේදී පැළඳීම සඳහා ලාංඡනයක්ද ලබා දීමට දෙමාපිය කමිටුව සූදානම් කර ඇත.

13 වන සංවත්සරය සැමරීම සඳහා නිකුත් කරන සඟරාවද මෙදින බෙදා හරින අතර උත්සවය සඳහා විශේෂයෙන් නිෂ්පාදනය කරන ලද වීඩියෝ පටයද ප්‍රදර්ශනය කරනු ඇත.

උත්සවය උදෑසන 8.45ට ආරම්භ වන නිසා කරුණාකර ඔබගේ දරුවන් උදෑසන 8.30ට දහම් පාසල් ශාලාවේ අසුන් ගැනීමට සලස්වන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

මෙදින සවස් වරුවේ පන්ති නොපැවෙත්වන අතර එම දරුවන් ද උදෑසන පැවැත්වෙන උත්සවයට සහභාගී කරවන්න.

මෙම උත්සවය සාර්ථක කරගැනීමට ඔබ සැමගේ පැමිණීම සහ සහයෝගය අපේක්ෂා කරමු.

ස්තුතියි,
සංවිධායක මණ්ඩලය

1314-42